## කුට්ටම් පොකුණ



ලක්ෂ්මන් කොඩිතුවක්කු

# මුල්ලේරියා වෙලේ වතුර



"අයියන්ඩි මා නම් හිතුවෙ මුල්ලේරියා සේනාංකයක් කොළොන්නාව වෙත යවන්න. ඊට පසු සීතාවක දස දහස අතුරුගිරිය පැත්තෙන් එවා කොළොන්නාව ඉස්මත්තට ගන්න." රාජසිංහ කීවේය.

"එහෙම නෙවෙයි මලයන්ඩි කොළොන්නාව හට පිරිස් ආපසු මුල්ලේරියාවට ගෙන්වා ගන්න." රන්ගේ බණ්ඩාර කීවේය.

"ඇයිද ! එසේ යෝජනා කළේ ? ඒකනායක සෙන්පති ඇසීය.

මෙවර පරංගීන් දෙදහසක් සටනට එන බව සැළවී තිබෙනවා ඒ සා විශාල පිරිසක් ගෙන්වා ගත හැකි රණබිමක් කොළොන්නාවෙ නැහැ. මෙවර අප කළ යුත්තේ ඔය දෙදහසම එක තැනකට කොටු කර ගැනීමයි. එයට හොඳම භූමිය මුල්ලේරියා වෙල් යායයි. අප මුල්ලේරියා වෙල් යාය අවට සිටින බව ඔවුනට හැඟවිය යුතුයි. එවිට ඔවුන් අප නසා දැමීමේ අරමුණ ඇතිව ඒවි.... රන්ගේ බණ්ඩාර කීහ.

"කදිම යෝජනාවක් දැල් එලා මසුන් මරන්නා කටු පඳුරුවලට දැල් එලන්නේ නැහැනෙ. දැල එලාගන්න ඕනෙ ඉඩපාඩු ඇති තැනක." ඒකනායක සෙනෙවි කීහ.

කස්තුරි තිලක සැදි නළලත සුමටාන
පුල් මහතෙල් මල් දම් හිස දවටාන
සලෙළුන් යනෙන නිති කැරැකෙළි කවටාන
රිවි මුදුනත වන මැද වදු සුමුටාන

සුමුටාන යනු හිඹුටානය. හිඹුටාන යනු මුල්ලේරියා ගම් බිම් මානයයි.

බන්නේ මරා මිනිදුල පබළු මුතුපොට
වැන්නේ ගමඩු ගෙල පලමල් කුඹුකුවට
ගන්නේ තසිත එබැවින් නොවැඳ කෙළියට
යන්නේ වෙළඳගොඩ දැක මද කලක් සිට

වෙළඳගොඩ යනු අද අංගොඩයි. එදා රහල් හිමියන් සැළලිහිණි සංදේශය තුළින් හිඹුටානත් අංගොඩත් වර්ණනා කළේ ඒ අන්දමනි.

මා ඉහත දෙබස් කණ්ඩ හා මුල්ලේරියාව පිළිබඳ පාඨයන් උපුටාගත්තේ අශෝක ප්‍රේමචන්ද්‍ර මහතාගේ මෑතකදී දොරට වැඩි "මුල්ලේරියා අභිමානය" පුස්තකය තුළිනි. එහෙත් එදා අපි අභිමානයෙන් කතා කළ මුල්ලේරියාව පිළිබඳව නොවේ අද මා ලිවීමට යන්නේ. අවමානයට පත් මුල්ලේරියාව ගැනය. මුල්ලේරියාව යනු මගේ ගම් පියසයි. මාගේ පමණක් නොව අශෝක ප්‍රේමචන්ද්‍ර මහතා ඇතුළු මාගේ මවගේ පාර්ශවයේ මුත්තන්, කිරිකිත්තන් උපන් අභිමානවත් ගම් පියසයි. අශෝක ප්‍රේමචන්ද්‍ර මහතා මාගේ මව්පස ඥාතියෙකි. මා කුඩා කළ කොළොම්පුර ජීවත් වී අධ්‍යාපනය ලැබුවත් පාසල් නිවාඩුවක් ලැබෙනතෙක් ඉස්පාසුවක් නැතිව ඉන්නේ හිඹුටානේ ආච්චිලාගේ ගෙදර එන්නටය. මාදං, හිඹුටු, රඹුටන් පේර වැල වරකා ආදී පළතුරුවලින් ගහන එදා සුන්දර ගම් පියසක් වූ හිඹුටාන මුල්ලේරියාව වෙල්යායන් අද බොහොමයක් ගොඩවී, පළතුරු වඳ වී ජනගහණයන් වර්ධනය වී ඇත. සිවලුන්, සාවුන්, කබරගොයින්, තලගොයින්, කුරුල්ලන්, ලේනුන් වෙල් මාළුන්ගෙන් පිරී තිබූ ගම් පියස තුළ අද රජ කරන්නේ අණක් ගුණක් නැති මිනිස් විෂ පිරි අමන මිනිසුන්ට මුල්ලේරියා වෙලේ වතුර එදා ලෙයට හැරවුනේ අපේ මව්බිම ආක්‍රමණිකයන් බේරාගන්නට සටන් කළ වීර සෙන්පතියන් අතිනි. අද මුල්ලේරියා ලේ පාරදිගේ පාවී යන්නේ පාතාල ලොක්කන් හා මත්කුඩු වෙළෙන්දන් අතිනි. භාරත ලක්ෂමන් ප්‍රේමචන්ද්‍ර යනු මත්කුඩු වෙළෙන්දන්ට එරෙහිව හඬ නැගූ මිනිසෙකි. දුමින්ද ගේ සහචරයන් අතින් වෙඩි වැදී භාරත ඇද වැටුණු ස්ථානය හා ඔවුන් එකිනෙකට මුණගැසුණු ස්ථානය මෙයට පෙරද මතක හිටින සටහනක් තැබූ ස්ථානයකි. ඒ 1988 - 89 භීෂණ සමයේ වැලිකඩ බන්ධනාගාරය පහර දී පළා ආ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ කැරළිකරුවන්ට හමුදාව පෙරළා වෙඩි තබන විට, එසේ වෙඩි වැදී ඇද වැටුණු සගයෙකු ඔවුන් ඔසවාගෙන විත් සඟවාගෙන සිටියේ ඒ අසළ පවත්වාගෙන ගිය රහසිගත කඳවුරක් වූ ඔවුන්ගේ නිවාසයකය. එහෙත් එදා පළා ආ ඔවුන් හමුදාව සොයාගත නොහැකි විය. අන්තිමේදී වෙඩි වැදී මියගිය තම සගයා ඒ ගේ මැද වළක් කපා ඔවුහු මිහිදන් කළහ. අවසානයේ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය ඇතුළු නායකයන් ටයර් සෑවල පිළිස්සෙද්දී එහි නායකයකුගෙන් ලද කට උත්තරයක් අනුව ඔහුගේ ඇටකටු ගොඩ ගත්හ.

උතුරු කොළඹ එක්සත් ජාතික පක්ෂ සංවිධායකවරයාව සිට පසුව මන්ත්‍රී පදවිය ලද දුමින්ද සිල්වා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එකතුවී මහින්ද චින්තනය වැළඳ ගත්තේ තම සහෝදරයාගේ ගුවන් විදුලි නාලිකාව බේරාගැනීමට හා තමා වටා සිටින මත්කුඩු ව්‍යාපාරිකයන් බේරාගැනීමටය යන්න ශ්‍රී ලංකාවේ දේශපාලනය නොකරන ඡන්දය අහිමි කොළු පැංචකු පවා දන්නා කාරණයකි. ඔහු මත්කුඩු හා බැඳුණු තම සේනාංකය සමඟ මුල්ලේරියාව තුළ කඳවුරු බැඳගත්තේ එහි පැරණි සංවිධායකවරයාව සිටි භාරත ලක්ෂමන් ප්‍රේමචන්ද්‍ර නැමැති ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් දහදිය ශ්‍රමය වැය කළ, පක්ෂය වෙනුවෙන් උපරිමයෙන් අවංකව කැපවූ උග්‍ර ශ්‍රීලනිප පාක්ෂිකයාටද හීන් නූලෙන් කටුව ගසාය. කොළොන්නාව, මුල්ලේරියාව ප්‍රදේශයේ දුප්පත් ඡන්ද දායකයන්ට මුදල් බත් පැකට් බෙදන්නට ඔහුට ධනය සැපයුවේ ඔහු වටා සිටින කෝටිපති ව්‍යාපාරිකයන් බව කොළොන්නාව ප්‍රදේශවාසීන් කවුරුත් දනිති. විරැකියාව හා දරිද්‍රතාවයන්ගෙන් පෙළෙන පැල්පත් වාසීන් ඔවුනට අවනත වී තම ඡන්දය පාවිච්චි කරන්නේ ශ්‍රීලනිපක්ෂය වෙනුවෙන් යැයි එම පක්ෂ නායකයන් සිතනවා නම් එය ඔවුන් මං මුලාවූ ප්‍රථම මුලාවයි.

එදා ටිකිරි කුමරු, පලංගි පරවා හැරීමට සේනාංකය රැස් කළ විරුවරු උපන් බිමේ මෙදා දුමින්ද සිල්වා තම පාතාලයේ සොල්දාදුවන් සමඟ ප්‍රාදේශීය සභා ඡන්දය දින කරක් ගැසුවේ භාරත ලක්ෂමන් බිල්ලට ගැනීමට නොවේ. ඔහුගේ එකම අභිප්‍රාය වූයේ භාරත ලක්ෂමන්ට හිතවත් ප්‍රාදේශීය සභා සභාපතිවරයා වූ සෝලංග ආරච්චි බිල්ලට ගැනීමටයි. දුමින්ද සිල්වා ඇතුළු ඔහුගේ සගයන් ප්‍රසන්න සෝලංග ආරච්චිගේ කාර්යාලය අසළ කරක් ගසා නැති තැන ඔහුගේ බිරිඳට අඩන්තේට්ටම් කළේ ඒ නිසාය. කරාටේ ධම්මික නොහොත් ප්‍රදීප් කුමාරගේ ඥාති පුත්‍රයා ප්‍රාදේශීය සභා සභාපති දුටුවේ වාඩි කරවීමට ඔහු වියදම් කළ මුදල් අන්තිමේදී ගඟට කැපූ ඉනිමන් බව ඡන්දයට සූදානම් වී දවල් වරුව වනවිටම දුමින්ද සිල්වාට අවබෝධ විය. ඊට පසු ඔහු හැසිරෙන්නට වූයේ පිස්සකු මෙන්ය. භාරත ලක්ෂමන් ප්‍රේමචන්ද්‍ර මහතා පරලොව යවා ඔහුගේ හිසටත් වෙඩි වදින වෙලාව පැමිණෙන විට මුල්ලේරියාව ඡන්දදායකයා තම කැමැත්ත ප්‍රකාශකර හමාරය. ප්‍රසන්න සෝලංග ආරච්චි නමැති ජනතාව සමඟ සිටි ප්‍රාදේශීය සභා නායකයා ඡන්ද හතලිස් පන්දහසක් ලබාගන්නා විට පාතාලය පිරිවරාගෙන සිටි දුමින්ද සිල්වාගේ සගයා නොහොත් කරාටේ ධම්මිගේ ඥාතියා ඡන්ද හාරදහසක් වැනි සුළුතරයක් ලද්දේ කෙසේදැයි සේම ශ්‍රීලනිපයට සෙනඟ අද්දවා දෙන දුමින්ද සිල්වා අවංක යැයි බණ දේශනා කරන ආරක්ෂක ලේකම්වරයා කල්පනා කළයුතු කරුණකි. ආරක්ෂක ලේකම්වරයා විසින් කරට ගෙන කටයුතු කළ කොළඹ පැල්පත් සුද්ද කරනවිට පැල්පත්වාසීන්ගෙන් එන විරෝධතාවය දුමින්ද සිල්වා වැළැක්වූයේ පාතාලයේම වෙසෙන සොල්දාදුවන් හරහාය. පාතාලයත්, මත්කුඩු වර්ධනයත් එකල තාවකාලිකව නවතා එයට සම්බන්ධ ඉහළ නිළධාරීන්ද එහාට මෙහාට මාරු කරමින් ආරක්ෂක අමාත්‍යංශය ක්‍රියා කළේ කොළඹ ලස්සන කරන්නටය. ඒ අවස්ථාව වන විට ඡන්දවලට මුහුණ දෙමින් සිටි රජය පාතාල මර්ධනය මදකට නතර කර කොළඹ ලස්සන කළේ කොළඹ නගර සභාව දිනා ගන්නටය. කොළඹ ලස්සන කිරීම යහපත් කාර්යයක් වුවත්, පාතාල මර්ධන කටයුතු නතර කර දුමින්ද සිල්වා සමඟ පාතාලය සම්බන්ධ කරගැනීම නොහොබිනා ක්‍රියාවක් බව රජය අවබෝධ කරගන්නා විට ජනාධිපතිට හිතවත් වෘත්තීය සමිති අධ්‍යක්ෂවරයා, උපදේශකවරයා සේම, ගෝඨාභය රාජපක්ෂට හිතවත් දුමින්ද සිල්වා අතර පැවති වෛරයේ ගිනිදැල්වල අවසාන ජවනිකාව පැමිණ තිබුණෝය. එසේම ජනතාව තුළ රජය පිළිබඳව විරෝධාකල්ප සේම යම් කුතුහලයක් මතුවන්නේ මෙතරම් ජනතාවාදී පක්ෂයක් වූ ශ්‍රීලනිපයට ජනතාව අද්දවාගැනීමට තරම් බංකොලොත්භාවයට පත්වූයේ කෙසේද යන්නය. එසේම දුමින්ද සිල්වා එම ජනතාව අඳින අධීක්ෂණ මන්ත්‍රීවරයකු වූයේ කෙසේද යන්නය.

එදා භාරත මියගිය දිනයේ දුමින්දගේ සේනාවේ සිටියේ රු. හත්සිය පනහේ කුලියටත් මිනීමැරූ අධම පාතාල නායකයන්ය. ඔවුන්ට එදා දිනයේ විස්කි බී බුරියානි කන්නට දුමින්ද රුපියල් විසිදහසේ නෝට්ටු විසිකරන විට, එදා වේල හොයාගන්නට පොරකන අහිංසක ඡන්ද දායකයන් පෝලිමේ සිටියේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ඡන්දය පාවිච්චි කරන්නටය.

අතීතයේ කොළොන්නාවේ ජනතාව වෙනුවෙන් පාර්ලිමේන්තුව නියෝජනය කළ සිරිමා බණ්ඩාරනායක රජයේ වෙළඳ ඇමතවරයා සිටි ටී.බී. ඉලංගරත්න වැනි මහත්මා දේශපාලකයන් දෙස නැවත හැරී බලන කළ දුමින්ද සිල්වා වැනි දේශපාලනය පිළිබඳව අනවබෝධයක් ඇති මන්තීවරයකු පොළොන්නරුවේ මුල්ලේරියාව ප්‍රදේශය තුළ ජනතාවට ලැබුණේ අද පැවැත්වෙන දිස්ත්‍රික් ඡන්ද ක්‍රමයේ වරදිනි. ඔහු ඉලංගරත්නගෙන් පසු කොළොන්නාව නියෝජනය කළ හැත්ත හතේ මැතිවරණයේ සුළඟට ගසාගෙන ආ වීරසිංහ මල්ලිමාරච්චිටත් වඩා චණ්ඩිකම්වලින් ඉහවහා ගිය මන්ත්‍රීවරයෙකි. අන්තිමේදී කොළඹ සංවර්ධනය කරගන්නට ලංකරගත් දුමින්ද සිල්වා මන්ත්‍රීවරයා හේතුවෙන් රජයට ලැබුණු කළු පැල්ලම කිසිදිනක මැකිය නොහැකිය. දුමින්ද සිල්වාට සුදු හුණු ගෑමෙන් තාවකාලික සැනසිල්ලක්ද ලද නොහැකිය. මේ මනාප ඡන්ද ක්‍රමයෙන් එදා පැවති සුළුතර පක්ෂවලට යම් තරමක වාසියක් ලැබුණද, අද එයින් ලැබෙන වාසිය ඔවුනට ලබාගත හැක්කේ බලය තිබෙන පක්ෂ සමඟ එකතුවුවහොත් පමණි. නමුත් දුමින්ද හා භාරත අතර පැවති යුද්ධය මනාප ඡන්ද ක්‍රමයේ සිදු වූ වරදකින් යැයි කවුරු හෝ සිතන්නේ නම් එයද මුලාවකි. එය මත්කුඩු විරෝධී හා මත්කුඩු ව්‍යාපාරිකයන් අතර පැවති සටනක ප්‍රතිඵලකයැයි කිවහොත් එයද වැරදිය. ඇත්තෙන් ම එය කොළොන්නාව ආසනය නියෝජනය කිරීමට ලොල් වූ දෙදෙනකු අතර සටනකි. කලින් මෙයට තිදෙනකු සිටියේය. ඒ නාවලගේ බෙනට් කුරේ නම් හිටපු පාර්ලිමේන්තු


